ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව

උපාධි වැඩසටහන 3වන මට්ටම - 2020/2021

අවසාන පරීක්ෂණය

මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපන පර්යාලෝක - EPU3331

කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2023.01.07 වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

<u>I වන කොටස</u>

01. ශිෂ්‍ය කේන්ද්‍රිය ඉගෙනීම යන සංකල්පය කෙටියෙන් විස්තර කරන්න.

02. Edgar Frio ere විසින් "අද සහ හෙට සඳහා අධ්‍යාපනය ඉගෙනීම" යන යුනෙස්කෝ වාර්තාවේ පෙන්වා දී ඇති ඉලක්ක හතර (04) කුමක් ද?

03. "දරුවා ස්වයං ඉගෙන ගන්නකු ලෙස" කෙටියෙන් විස්තර කරන්න.

04. 'පවුල' යන යෙදුම නිර්වචනය කරන්න.

05. මුල් ළමාවිය අධ්‍යාපනයේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

06. බහු ආංශික ප්‍රවේශය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?

07. ප්‍රාථමික අධ්‍යාපනයේ අරමුණු පැහැදිලි කරන්න.

08. 1972 දී ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මඟින් හඳුන්වා දුන් ප්‍රධාන අරමුණු පහ **(05)** මොනවා ද?

(ලකුණු 05x08 = 40)

## 2 වන කොටස

09. (i) මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ පියාජේ ගේ දාර්ශනික අදහස් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) පියාජේගේ දර්ශනය වර්තමාන ශ්‍රී ලාංකික සංදර්භයේ මුල් ළමාවිය අධ්‍යාපනයට කෙතරම් දුරට අදාළ වේද යන්න විමර්ශනය කරන්න. (ලකුණු 12)

10. (i) "ප්‍රාථමික පාසල් සැකසීමේ දී ගුරුවරයාගේ කාර්යභාරය වන්නේ ලෝකය ගැන දැනුවත්වීමට පරිසරය සැකසීමයි." ඉහත ප්‍රකාශයෙන් අදහස් වන්නේ කුමක් ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) පහත සඳහන් ප්‍රකාශය සුදුසු උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

"ප්‍රාථමික පසුබිම තුළ සිසුන්ට මඟ පෙන්වන ගුරුවරයාගේ කාර්යභාරය සන්නිවේදන හා නිර්මාණාත්මක නිපුණතා තිබිය යුතුය." (ලකුණු 10)

11. (i) ක්‍රියාකාරකමක් මඟින් ඉගෙනීම ප්‍රවර්ධනය සඳහා ප්‍රාථමික ගුරුවරයාට පන්ති කාමරය තුළ ක්‍රියාත්මක කළ හැකි උපාය මාර්ග මොනවා ද? ඔබේ පිළිතුර සඳහා උදාහරණ සපයන්න. (ලකුණු 10)

(ii) ක්‍රියාකාරකම් මඟින් ඉගෙනීම ක්‍රියාත්මක කිරීමේ දී ගුරුවරයා මුහුණ පාන අභියෝග පහක් **(05)** සඳහන් කරන්න.
එම අභියෝග ජය ගැනීම සඳහා ඔබ කරන යෝජනා මොනවා ද? (ලකුණු 10)

12. (i) ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය සඳහා 1997 දී හඳුන්වා දෙන ලද ප්‍රධාන ප්‍රතිසංස්කරණ යෝජනා මොනවා ද? (ලකුණු 10)

(ii) පහත සඳහන් කරුණු සලකා බලා ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ලබා දී ඇති අවස්ථා සාකච්ඡා කරන්න.

(1) ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශය
(2) මූලික අවශ්‍යතා
(3) අධ්‍යාපන සම්පත් (ලකුණු 10)

13. (i) සැමට අධ්‍යාපනය සහතික කිරීම සඳහා ජොම්තියන් සමුළුවේ දී එළැඹුණු තීරණ මොනවා ද? (ලකුණු 06)

(ii) සැමට අධ්‍යාපනය සහතික කිරීම සඳහා 1990 සිට ශ්‍රී ලංකාව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග ලැයිස්තු ගත කරන්න. (ලකුණු 06)

(iii) ඉහත සඳහන් කළ කරුණු අතරින් දෙකක් **(02)** තෝරාගෙන, සාක්ෂි සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.